සැ. යු.- 2016.05.13 දින පළ වූ අංක 1,967 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,968 - 2016 මැයි මස 20 වැනි සිකුරාදා - 2016.05.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 562 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 564 |


*සැ. යු.* - අකුරණ බයිතුස් සකාත් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 අප්‍රේල් මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජූනි මස 10 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මැයි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

## පළාත්බද මහාධිකරණය - කෑගල්ල

### කාලය ඉකුත් වූ නඩු වාර්තා විනාශ කිරීම

මෙම අධිකරණයේ ඇති දැනට වසර 05කට පෙර අවසන් වී ඇති පහත උපලේඛනයේ දැක්වෙන නඩු වාර්තා 2016.08.20 දිනෙන් පසුව අධිකරණ භූමියේ දී පුළුස්සා විනාශ කිරීමට සූදානම් කර ඇත.

02. මෙහි සඳහන් නඩු සම්බන්ධයෙන් යම් පාර්ශ්වකරුවෙකුට තමාට අවශ්‍ය නඩුවේ සම්පූර්ණ පිටපතක් හෝ එහි යම් කොටසක් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා ඉල්ලුම් පත්‍ර 2016.08.20 වැනි දිනට පෙර මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. එසේ ඉල්ලීමක් නොවුවහොත් පහත උපලේඛනයේ සඳහන් නඩු වාර්තා 2016.08.20 දිනෙන් පසුව මෙම අධිකරණ භූමියේ දී පුළුස්සා විනාශ කරන බව මෙයින් දන්වා සිටිමි.

ධම්මික ගනේපොල,
මහාධිකරණ විනිසුරු - කෑගල්ල.

2016 අප්‍රේල් මස 26 වැනි දින,
කෑගල්ල මහාධිකරණයේ දී ය.

**උපලේඛනය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඇප නඩු | 2660 | 3337 | 3424 | 3552 | 3591 | 3640 | 3670 |
| | 2664 | 3339 | 3431 | 3555 | 3592 | 3641 | 3671 |
| 868 | 2668 | 3342 | 3434 | 3556 | 3593 | 3642 | 3672 |
| 993 | 2671 | 3365 | 3443 | 3557 | 3597 | 3643 | 3675 |
| 1213 | 2673 | 3367 | 3444 | 3558 | 3598 | 3644 | 3676 |
| 1519 | 2674 | 3368 | 3487 | 3561 | 3599 | 3645 | 3677 |
| 1645 | 2687 | 3369 | 3489 | 3562 | 3601 | 3646 | 3678 |
| 1971 | 2692 | 3370 | 3491 | 3563 | 3602 | 3647 | 3679 |
| 2613 | 2695 | 3373 | 3501 | 3564 | 3603 | 3648 | 3680 |
| 2614 | 3180 | 3374 | 3505 | 3567 | 3604 | 3649 | 3683 |
| 2615 | 3217 | 3375 | 3509 | 3568 | 3608 | 3651 | 3689 |
| 2616 | 3218 | 3376 | 3516 | 3569 | 3609 | 3652 | 3698 |
| 2617 | 3224 | 3377 | 3520 | 3570 | 3612 | 3654 | 3702 |
| 2618 | 3230 | 3378 | 3521 | 3571 | 3615 | 3655 | 3704 |
| 2621 | 3236 | 3379 | 3522 | 3572 | 3616 | 3656 | 3705 |
| 2622 | 3251 | 3381 | 3523 | 3574 | 3617 | 3657 | 3712 |
| 2623 | 3256 | 3384 | 3533 | 3575 | 3618 | 3658 | 3713 |
| 2624 | 3262 | 3385 | 3534 | 3576 | 3619 | 3659 | 3715 |
| 2626 | 3281 | 3386 | 3537 | 3579 | 3621 | 3660 | 3716 |
| 2632 | 3282 | 3387 | 3540 | 3580 | 3622 | 3661 | 3717 |
| 2633 | 3283 | 3390 | 3542 | 3581 | 3623 | 3662 | 3718 |
| 2640 | 3302 | 3393 | 3543 | 3584 | 3627 | 3663 | 3719 |
| 2645 | 3304 | 3394 | 3545 | 3586 | 3628 | 3664 | 3727 |
| 2652 | 3321 | 3395 | 3547 | 3587 | 3632 | 3665 | 3728 |
| 2653 | 3322 | 3406 | 3548 | 3589 | 3634 | 3667 | 3729 |
| 2657 | 3336 | 3420 | 3549 | 3590 | 3635 | 3669 | 3730 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3732 | 3878 | 49 | 2662 | 3285 | 2546 | 2960 | 3296 |
| 3736 | 3883 | 94 | 2670 | 3287 | 2562 | 2961 | 3318 |
| 3743 | 3884 | 529 | 2679 | 3288 | 2571 | 2964 | 3323 |
| 3746 | 3886 | 577 | 2685 | 3297 | 2583 | 2965 | 3324 |
| 3747 | 3887 | 668 | 2690 | 3298 | 2656 | 2966 | 3327 |
| 3751 | 3890 | 678 | 2697 | 3306 | 2661 | 2967 | 3328 |
| 3753 | 3891 | 1807 | 2702 | 3348 | 2738 | 2968 | 3331 |
| 3756 | 3892 | 1897 | 2725 | 3349 | 2745 | 2969 | 3334 |
| 3757 | 3893 | 1952 | 2788 | 3350 | 2748 | 2970 | 3335 |
| 3759 | 3894 | 1979 | 2795 | 3357 | 2756 | 2971 | 3340 |
| 3760 | 3895 | 2001 | 2797 | 3359 | 2763 | 2972 | 3343 |
| 3762 | 3896 | 2044 | 2800 | 3362 | 2769 | 2973 | 3364 |
| 3763 | 3897 | 2077 | 2801 | 3363 | 2775 | 2974 | 3380 |
| 3764 | 3898 | 2092 | 2857 | 3397 | 2776 | 2975 | 3382 |
| 3765 | 3899 | 2115 | 2891 | 3456 | 2778 | 2976 | 3388 |
| 3770 | 3900 | 2129 | 2946 | 3469 | 2789 | 2977 | 3391 |
| 3772 | 3904 | 2176 | 2997 | 3488 | 2796 | 2978 | 3418 |
| 3773 | 3906 | 2179 | 3000 | 3495 | 2802 | 2979 | 3419 |
| 3778 | 3907 | 2180 | 3003 | 3498 | 2804 | 2980 | 3429 |
| 3780 | 3908 | 2183 | 3005 | 3503 | 2806 | 2981 | 3439 |
| 3782 | 3909 | 2191 | 3018 | 3525 | 2811 | 2982 | 3440 |
| 3783 | 3910 | 2194 | 3020 | 3531 | 2814 | 2983 | 3459 |
| 3784 | 3915 | 2196 | 3021 | 3538 | 2817 | 2984 | 3461 |
| 3785 | 3916 | 2199 | 3024 | 3539 | 2820 | 2985 | 3465 |
| 3786 | 3917 | 2207 | 3078 | 3551 | 2823 | 2986 | 3466 |
| 3787 | 3919 | 2212 | 3081 | 3553 | 2824 | 2987 | 3476 |
| 3790 | 3920 | 2236 | 3082 | 3573 | 2826 | 2988 | 3477 |
| 3792 | 3921 | 2244 | 3083 | 3583 | 2828 | 2989 | 3478 |
| 3795 | 3923 | 2247 | 3088 | 3611 | 2841 | 2990 | 3479 |
| 3796 | 3927 | 2250 | 3089 | 3741 | 2842 | 2991 | 3480 |
| 3798 | 3930 | 2254 | 3102 | 3742 | 2847 | 2992 | 3481 |
| 3800 | 3931 | 2256 | 3127 | 3745 | 2851 | 2993 | 3483 |
| 3807 | 3932 | 2260 | 3139 | 3754 | 2854 | 2995 | 3490 |
| 3808 | 3935 | 2261 | 3145 | 3853 | 2858 | 2996 | 3532 |
| 3810 | 3937 | 2300 | 3147 | 3902 | 2859 | 3002 | 3541 |
| 3812 | 3941 | 2301 | 3156 | 3914 | 2860 | 3008 | 3544 |
| 3814 | 3948 | 2348 | 3196 | | 2861 | 3016 | 3550 |
| 3815 | 3950 | 2380 | 3202 | ප්‍රති නඩු | 2862 | 3085 | 3554 |
| 3816 | 3960 | 2386 | 3213 | | 2863 | 3091 | 3559 |
| 3819 | 3963 | 2397 | 3221 | 1164 | 2868 | 3151 | 3605 |
| 3822 | 3965 | 2425 | 3223 | 2119 | 2870 | 3186 | 3614 |
| 3823 | 3966 | 2480 | 3227 | 2206 | 2873 | 3220 | 3636 |
| 3826 | 3967 | 2499 | 3228 | 2313 | 2877 | 3226 | 3673 |
| 3828 | 3990 | 2547 | 3248 | 2321 | 2887 | 3232 | 3693 |
| 3868 | 3991 | 2595 | 3254 | 2324 | 2899 | 3270 | 3706 |
| 3870 | | 2597 | 3255 | 2414 | 2955 | 3279 | 3707 |
| 3871 | අභි නඩු | 2602 | 3269 | 2419 | 2956 | 3286 | 3720 |
| 3874 | | 2636 | 3271 | 2489 | 2957 | 3293 | 3733 |
| 3875 | 13 | 2638 | 3272 | 2522 | 2958 | 3294 | 3734 |
| 3877 | 48 | 2644 | 3276 | 2533 | 2959 | 3295 | 3735 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3737 | 71/90 | 392/87 | 956/93 | 1260/97 | 1636/01 | 2035/04 | 2535/06 |
| 3777 | 72/92 | 393/87 | 1061/94 | 1267/98 | 1643/01 | 2045/04 | 2592/07 |
| 3794 | 77/90 | 465/89 | 1079/97 | 1316/99 | 1657/01 | 2082/05 | 2639/07 |
| 3811 | 108/92 | 477/89 | 1102/94 | 1318/96 | 1684/01 | 2078/05 | 2663/07 |
| 3867 | 168/73 | 536/93 | 1127/94 | 1330/99 | 1698/02 | 2103/05 | 2685/07 |
| 3911 | 171/92 | 541/91 | 1129/94 | 1397/99 | 1706/02 | 2130/05 | 2704/07 |
| 3951 | 175/92 | 543/91 | 1135/95 | 1401/99 | 1730/02 | 2185/05 | 2718/07 |
| 3954 | 195/78 | 547/91 | 1140/95 | 1406/99 | 1769/02 | 2202/05 | 3430/06 |
| 3955 | 207/92 | 551/91 | 1158/95 | 1419/00 | 1780/02 | 2203/05 | |
| 3956 | 216/78 | 561/91 | 1167/95 | 1421/00 | 1828/03 | 2204/05 | රිට් නඩු |
| 3964 | 222/79 | 591/93 | 1168/95 | 1429/00 | 1851/03 | 2226/05 | |
| | 230/79 | 598/91 | 1170/95 | 1430/00 | 1865/03 | 2255/06 | 161 |
| අපරාධ | 249/80 | 599/91 | 1178/96 | 1437/00 | 1873/03 | 2260/06 | 233 |
| | 287/81 | 601/91 | 1182/96 | 1446/00 | 1874/03 | 2280/06 | 1566 |
| 6/80 | 287/81 | 609/91 | 1185/96 | 1475/00 | 1883/03 | 2299/06 | |
| 10/74 | 305/92 | 610/91 | 1212/96 | 1497/00 | 1885/03 | 2321/06 | ඉල්ලීම් |
| 16/84 | 315/92 | 807/93 | 1219/96 | 1561/01 | 1898/03 | 2326/06 | |
| 18/74 | 327/82 | 848/84 | 1225/97 | 1585/01 | 1907/03 | 2345/06 | 85 |
| 30/76 | 340/92 | 860/93 | 1234/97 | 1610/01 | 1936/03 | 2363/06 | 100 |
| 33/92 | 370/92 | 914/93 | 1251/97 | 1617/01 | 1942/03 | 2377/06 | 232 |
| 37/89 | 387/92 | 949/93 | 1259/97 | 1631/01 | 1943/03 | 2431/06 | 463 |
| | | | | | | 2514/06 | 740 |
| | | | | | | | 108 |

05-463

---

# විවිධ දැන්වීම්

## ''සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ජේ. එම්. ආනන්ද කුමාරසිරි නමැති මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ ''සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජනසේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ''සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජනසේවා පදනම'' සංස්ථාගත කිරීමයි :-

*(අ)* සත්‍ය ශ්‍රී කැලේ ගණපති දේවාලය සහ පූජා භූමිය ප්‍රතිසංස්කරණය කිරීම,

*(ආ)* බැතිමතුන්ගේ පහසුව සඳහා නොමිලේ නවාතැන් පහසුකම් ලබාගත හැකි විශ්‍රාම ශාලාවක් සහ අදළ යටිතල පහසුකම් ගොඩ නැගීම ; සහ

*(ඇ)* රැකියා විරහිත තරුණ තරුණියන්ට දේවාලයට සම්බන්ධ අනුග්‍රාහකයන් මගින් වෘත්තීය පුහුණු ලබාදීමට කටයුතු කිරීම සහ රැකියා අවස්ථාවන්ට යොමු කිරීම,

යනාදිය වේ.

ජේ. එම්. ආනන්ද කුමාරසිරි,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මොනරාගල දිස්ත්‍රික්කය.

05-519

## ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

කලාලුගොඩ කන්කානම්ගේ පියදස වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48 (1) යටතේ ''ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ''ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව'' සංස්ථාගත කිරීමයි :-

1. පාසල් අධ්‍යාපනයෙන් සමුගත් වයස අවුරුදු 16-25 අතර තරුණ තරුණියන් සඳහා ජාතික වෘත්තීය පුහුණු අධිකාරිය (NVTA) සමඟ එක්ව වෘත්තීය පුහුණුව ලබාදීම,

2. දිළිඳු දෙමාපියන්ගේ ළදරුවන් උදෙසා ළදරු පාසල් සේවාව ලබා දීම,

3. මත්ද්‍රව්‍යවලට නවකව ගතවන්නන් එයින් මුද ගැනීම සහ මුදගැනීමට අදාළ පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

4. ගැබිණි කාන්තාවන් හා කුඩා දරුවන් කායික සෞඛ්‍ය මත පෝෂණය කිරීම,

යනාදිය වේ.

කේ. කේ. පියදස,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
නුවරඑළිය දිස්ත්‍රික්කය.

05-662

---

## පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම

### (2014 අංක 44 දරන පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ පනත) මගින් සංස්ථාපිතයි)

පාලන රීති මාලාව

හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ ඇති 2014 අංක 44 දරන පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනතේ හත්වන වගන්තියේ විධිවිධාන අනුව පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනමේ (මින් මතු පදනම ලෙස කියවෙන) මහා සභාව විසින් 2016 අප්‍රේල් 20 වන දින දී අනුමත කර පනවනු ලබන එම පදනමේ පාලන රීති මාලාව ලෙස මෙය හැඳින්වේ.

01. සාමාජිකත්වය පිළිබඳ රීතිය

1.1 සාමාජිකත්වය වර්ග කිරීම

*(අ)* පදනමේ සාමාජිකයින් යාවජීව සාමාජිකයින් හා ආශ්‍රිත සාමාජිකයින් ලෙස වර්ග කෙරේ.

*(ආ)* පදනමේ යාවජීව සාමාජික සංඛ්‍යාව පනස් දෙනෙකු නොඉක්මා විය යුතු ය.

*(ඇ)* යාවජීව සාමාජිකයින් පදනමේ මහ සභාවේ සාමාජිකයින් වන්නේ ය.

*(ඈ)* පදනමේ සභාපතිවරයාගේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආශ්‍රිත සාමාජිකයින් බඳවාගනු ලබන අතර, ඔවුන් පදනමේ මහ සභා සාමාජිකයන් නොවන්නේ ය.

1.2 සාමාජිකයින් ඇතුළත් කර ගැනීම

(අ) යාවජීව සාමාජිකයන් ඇතුළත් කරගැනීමේ බලය සභාපතිතුමාගේ නිර්දේශය පරිදි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදුකළ යුතු වන්නේ ය.
(ආ) ආශ්‍රිත සාමාජිකයින් බඳවා ගැනීම සඳහා සභාපතිවරයාට බලය ඇත්තේ ය.

1.3 යාවජීව සාමාජිකයින් :

(අ) පී. හැරිසන් මැතිතුමා එම මැතිණිය හා එම දෙපලගේ වයස අවුරුදු දහ අටට වැඩි දරුවන් යාවජීව සාමාජිකයින් වන්නේ ය.
(ආ) පදනම සංස්ථාගත වූ 2014 නොවැම්බර් මස 24 වැනි දින වන විට පදනමේ සාමාජිකත්වය දැරූ සියලුදෙනා පදනමේ සාමාජිකයින් වන්නේ ය.
(ඇ) පදනමේ සභාපතිවරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් යාවජීව සාමාජිකත්වයට ඇතුළත් කරගැනීමට හැකි වන්නේ ය.
(ඈ) කෙසේ වුවද, සාමාජික සංඛ්‍යාව පනස් දෙනෙක් නොඉක්මවිය යුතු අතර, මෙම සංඛ්‍යාව ඉක්මවීම සඳහා රීති සංශෝධනයක් සඳහා මහ සභාවේ අනුමැතිය ලබාගත යුතු වන්නේ ය.

1.4 ආශ්‍රිත සාමාජිකයින් :

පදනමේ පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ඕනෑම අයෙකු ආශ්‍රිත සාමාජිකයින් ලෙස බඳවාගැනීම සඳහා පදනමේ සභාපතිවරයාට බලය ඇත්තේ ය.

1.5 යාවජීව සාමාජිකත්වයෙන් ඉවත් කිරීම :

(අ) යම් යාවජීව සාමාජිකයෙකු පදනමේ අභිවෘද්ධියට හා ඉදිරි පැවැත්මට හානිකර අයුරින් හැසිරීම පිළිබඳ වාර්තා වූ විට ලඝු පරීක්ෂණයකින් පසු ඔහු/ඇය ආශ්‍රිත සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත්තේ ය.
(ඇ) යාවජීව සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් කරුණු දක්වා සිටීමක් අවශ්‍ය නොවන්නේ ය.

1.6 ආශ්‍රිත සාමාජිකත්වයෙන් ඉවත් කිරීම හා නෙරපීම පදනමේ සභාපතිවරයාගේ අභිමතය පරිදි සිදුකළ හැකි වන්නේ ය.

1.7 සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම :

(අ) යාවජීව සාමාජිකත්වයෙන්, ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්විය හැකි අතර, තම ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.
(ආ) ඉහත (අ) අනුව ඉල්ලා අස්වීම පිළිගැනීම හෝ පිළිනොගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත.
(ඇ) ඉල්ලා අස්වීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ඒ බව ලිඛිතව අදාළ අයට දැන්විය යුතු ය.

1.8 සාමාජිකත්වය අහෝසිවීම :

පහත සඳහන් හේතුන් මත සාමාජිකත්වය අහෝසි වන්නේ ය.

(අ) සාමාජිකයාගේ මරණය.
(ආ) සාමාජිකයා සිහිවිකල් අයෙක් වීම හෝ සක්‍රියව සහභාගී වීමට නොහැකි තරම් ශාරීරික දුබලතාවයට පත්වීම.
(ඇ) අපරාධ නිමිත්තක් සම්බන්ධයෙන් වරදකරුවෙකු වීම හේතුවෙන් සිරගත වීම.

1.9 සාමාජික ගාස්තු :

*(අ)* සෑම යාවජීව සාමාජික සාමාජිකාවක් විසින්ම එක් වරක දී පමණක් ගෙවන සාමාජික ගාස්තුවක් ලෙස රුපියල් දහසක (1,000/-) මුදලක් පදනමට ගෙවිය යුතු වේ.

*(ආ)* සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම, ඉවත්කිරීම, අහෝසිවීම හේතුවෙන් මෙම සාමාජික ගාස්තු ආපසු ලබා ගැනීමට කිසිවෙකුට හිමිකමක් නැත.

02. පදනමේ මහා සභාව :

2.1 මහ සභා සංයුතිය හා ක්‍රියාකාරිත්වය

2.1.1 පදනමේ මහා සභාව එහි යාවජීව සාමාජිකයින්ගෙන් සමන්විත වන්නේ ය.

2.1.2 රීති 3.2 (අ) අනුව පත්වන පදනමේ සභාපතිවරයා ලෙස ක්‍රියා කරන තැනැත්තා මහා සභාවේ සභාපතිවරයා වන්නේය.

2.1.3 රීති 03(ආ) අනුව පත්කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / අධ්‍යක්ෂ (සංවර්ධන හා සමාජික කටයුතු) මහා සභාවේ ලේකම්වරයා වන්නේ ය.

2.2 මහ සභාවේ බලතල :

2.2.1 පදනමේ පරිපාලනය කළමනාකරණය හා ක්‍රියාකාරකම්වලට අදාළ රීති පැනවීම හා පවතින රීති කාලීනව සංශෝධනය කිරීම හා/හෝ පරිච්චින්න කිරීම.

2.2.2 වාර්ෂික අය වැය අනුමත කිරීම.

2.2.3 වාර්ෂික ක්‍රියාකාරී හා සංවර්ධන සැලසුම් අනුමත කිරීම.

2.2.4 රීති විධිවිධාන අනුව පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයයේ ඇති වන පුරප්පාඩු පිරවීම.

2.2.5 පදනමේ වාර්ෂික වාර්තා, ගිණුම් හා විගණන වර්තා සමාලෝචනය කිරීම හා අනුමත කිරීම.

2.3 මහ සභා රැස්වීම :

2.3.1 වාර්ෂිකව සංවත්සරික මහා සභා රැස්වීම ගිණුම් වර්ෂය අවසන්වී මාස 06ක් ඇතුළත පැවැත්විය යුතු වේ.

2.3.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි හෝ/හා සභාපතිවරයාගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක දී විශේෂ මහාසභා රැස්වීම් පැවැත්විය හැකි වන්නේ ය.

2.3.3 මහා සභා සාමාජික සංඛ්‍යාවෙන් 1/3ක ප්‍රමාණය මහා සභාවේ ගණපූර්ණය වන්නේ ය.

2.3.4 මහා සභා රැස්වීමක යෝජනා සම්බන්ධව තීරක ඡන්ද බලය සභාපතිවරයා සතු වන්නේ ය.

03. පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය :

3.1 පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් අවම වශයෙන් හත් දෙනෙකුගෙන් සමන්විත වියයුතු වන අතර, උපරිම සංඛ්‍යාව පහළොස් දෙනෙකු නොවික්ම විය යුතු වන්නේ ය.

3.2 පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වන්නේ ය.

*(අ)* පී. හැරිසන් මැතිතුමා පදනමේ නිලබලයෙන් සභාපතිවරයා සහ පදනමේ කළමනාකාර අධ්‍යක්ෂ වන්නේ ය.

*(ආ)* යාවජීව සාමාජිකයින් අතරින් දෙදෙනෙකු සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස පහත සඳහන් තනතුරු සඳහා පත්කරනු ලැබිය යුත්තේ ය.

1. ලේකම්/අධ්‍යක්ෂ (සංවර්ධන හා සාමාජික සබඳතා)
2. භාණ්ඩාගාරික/අධ්‍යක්ෂ (මුදල්)

*(ඇ)* මහා සභාව විසින් තම සාමාජිකයින් අතරින් සෙසු අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ලෙස තෝරා පත්කරගත යුතු වන්නේ ය.

*(ඈ)* එසේ තෝරාගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් වෙත විෂය පැවරීමේ බලය සභාපතිවරයා සතු වන්නේ ය.

3.3 අධ්‍යක්ෂ මණ්ඩල කාල සීමාව :

3.3.1 මහා සභාව විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නිල කාලය වසර 03ක් වන්නේ ය.

3.3.2 ඉහත 3.3.1 අනුව මහා සභාව විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරක් ඇබෑර්තු විටෙක, එම සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාජිකයින් අතුරින් අයෙක් ඇබෑර්තු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරට පත්කරනු ලැබිය හැක. ඉදින් එළඹෙන මහා සභා රැස්වීමේ දී ඒ සඳහා ආවරණ අනුමැතිය ලබාගැනීමට ක්‍රියාකළ යුතු වේ. ඇබෑර්තු පිරවීම සඳහා පත්කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ නිල කාලය පනතේ 2.3 (ඇ) වගන්තියේ විධිවිධාන අනුව වන්නේ ය.

3.3.3 රීති 3.2(අ) අනුව පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන්ගේ නිල කාලය වසර 03ක් විය යුතු අතර, ඒ අය ඉවත්කර වෙනත් යාවජීව සාමාජිකයින් අතරින් ඇබෑර්තු පිරවීම සඳහා සභාපතිවරයාට බලය ඇත්තේ ය. එසේ වුව ද, ඇබෑර්තු තනතුරු සඳහා පත්වන අයගේ නිලකාලය පනතේ 2.3 (ඇ) වගන්තිය අනුව විය යුතු ය.

3.4 අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල :

3.4.1 පදනමේ විධායක බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම බලතල සභාපතිවරයාට හා මණ්ඩලයේ සාමාජික අධ්‍යක්ෂවරුන් වෙත පවරනු ලැබිය හැක.

3.4.2 අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ බලය සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ වෙත පැවරේ.

3.5 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම :

3.5.1 අවම වශයෙන් තුන් මසකට එක් වරක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතු වේ.

3.5.2 පදනමේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ද ලේකම් වන අතර, ඔහු/ඇය විසින් විධිමත් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් කැඳවීම, වාර්තා තැබීම සිදුකළ යුතු වන්නේ ය.

3.5.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ මුලසුන සභාපතිවරයා/කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් දැරිය යුතු අතර, ඔහු නොමැති විටක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තාවකාලිකව පත්කරනු ලබන සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලයේ මුලසුන දැරිය යුතු වන්නේ ය.

3.5.4 අධ්‍යක්ෂ මණ්ඩලයේ ගණපූරණය මුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් වන්නේ ය.

3.5.5 අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් තීරක ඡන්ද බලය සභාපතිවරයා සතු වන්නේ ය.

3.6 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය අවසන් වීම.

පහත සඳහන් හේතු මත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය අවසන් වනු ඇත.

3.6.1 වසර තුනක නිල කාලය අවසන් වීම.

3.6.2 විධිමත් පරිදි ඉල්ලා අස්වීම.

3.6.3 සාමාජිකයාගේ මරණය.

3.6.4 සාමාජිකයා සිහි විකල්වීම හෝ ක්‍රියාකාරී වීම නොහැකි තරම් වූ ශාරීරික දුබලතාවයකට පත්වීම.

3.6.5 අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් කිරීම 2.3 (ඇ) අනුව පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් සඳහා පමණක් අදාළ වේ.

3.6.6 මහා සභාව විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් නෙරපීම.

3.6.7 රීති 1.8 අනුව පදනමේ යාවජීව සාමාජිකත්වය අහෝසි වීම.

3.7 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

3.7.1 අනුමත සැලසුම් හා අයවැය අනුව පදනමේ කටයුතු මෙහෙයවීම, නියාමනය හා ඇගයීම.

3.7.2 පදනමේ මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් මනාලෙස කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම.

3.7.3 පදනමේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම පිනිස අවශ්‍ය සියලු දෑ ඉටුකිරීම

3.7.4 මූල්‍ය හා මූල්‍ය නොවන ගනුදෙනු සියල්ල නිසිලෙස ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

3.7.5 වාර්ෂික අයවැය හා ක්‍රියාකාරී සැලසුම් සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම.

3.7.6 වාර්ෂික ගිණුම් හා විගණන වාර්තා මහා සභාවට ඉදිරිපත් කිරීම.

3.7.7 උපාය මාර්ගික සැළසුම් කිරීම් හා පදනමේ ප්‍රගතිය හා වර්ධනය සනාථ කිරීම.

3.7.8 පදනමට අවශ්‍ය කරන අරමුදල් සම්පාදනය සඳහා දේශීය හා විදේශීය ආධාර ලබාගැනීම හා ඊට අදාළ ගිවිසුම් වලට එළඹීමට කටයුතු කිරීම

3.7.9 පදනම වෙනුවෙන් වත්කම් අත්පත්කර ගැනීම, විකිණීම, උකස් කිරීම හා ඒ හා සම්බන්ධ ගිවිසුම්වලට එළඹීම

04. පදනමේ සභාපතිවරයා

4.1 පී. හැරිසන් මැතිතුමා පදනමේ යාවජීව සභාපතිවරයා වන්නේ ය.

4.2 පී. හැරිසන් මහතා සභාපති ධූරය දැරීමට නොහැකි අවස්ථාවේ දී එතුමාගේ කාලත්‍රයා හෝ අවුරුදු 18ට වැඩි දරුවෙකු පදනමේ සභාපති ධූරයට පත්වනු ඇත. මෙවැනි අවස්ථාවක දී නව සභාපතිවරයා කවරෙකු ද යන්න අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත දැන්විය යුතු අතර, ලේකම්වරයා විසින් නව පත්වීම පිළිබඳ මහ සභාව දැනුවත් කළ යුතු ය.

4.3 සභාපතිවරයා පදනමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ද වේ.

4.4 පදනමේ විධායක බලතල සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ සතුවන අතර, එම බලතල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

05. පදනමේ ලේකම්වරයා

5.1 3.2 (ආ) රීති අනුව සභාපතිවරයා විසින් තුන් අවුරුදු කාලයක් සඳහා පදනමේ ලේකම්වරයා පත්කරනු ඇත.

5.2 ඉහත 5.1 අනුව පත්කරනු ලබන ලේකම්වරයාගේ තුන් අවුරුදු කාලය ආරම්භ වන්නේ මහා සභාව විසින් රීති 3.2 (ඇ) අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කරනු ලබන දින සිට වේ.

5.3 පදනමේ ලේකම්වරයා එහි අධ්‍යක්ෂ (සංවර්ධන හා සාමාජික සම්බන්ධතා) ලෙස ක්‍රියාකළ යුතු ය.

5.4 සාමාජික ලේඛන විධිමත්ව පවත්වාගෙන යාම මහා සභා රැස්වීම් හා කැඳවීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම ලේකම්වරයා විසින් සිදුකළ යුතුය .

5.5 පනතේ විධිවිධානයන් පරිදි අවශ්‍ය කෙරෙන ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටුකිරීම ලේකම්වරයාගේ වගකීම වන්නේ ය.

5.6 අධ්‍යක්ෂ (සංවර්ධන හා සාමාජික සබඳතා) තනතුරට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන රාජකාරි ඉටුකිරීම.

06. පදනමේ භාණ්ඩාගාරිකවරයා

6.1 3.2 (ඇ) රීතිය අනුව සභාපතිවරයා විසින් පත්කරනු ඇත.

6.2 ඉහත 6.1 අනුව පත්කරනු ලබන භාණ්ඩාගාරිකවරයාගේ නිල කාලය වසර 03කි. එසේ වුව ද, නිල කාලය ආරම්භ වන්නේ රීති 3.3.3 අනුව මහා සභාව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන දිනයේ සිට ය.

6.3 පදනමේ භාණ්ඩාගාරිකවරයා එහි අධ්‍යක්ෂ (මුදල්) ලෙස ක්‍රියාකළ යුතු වේ.

6.4 විධිමත් පරිදි මූල්‍ය ගනුදෙනු කිරීම, මූල්‍ය ලේඛන පවත්වාගෙන යාම, ගිණුම් පවත්වාගෙන යාම, හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම භාණ්ඩාගාරිකවරයාගේ වගකීම වේ.

6.5 පදනමේ වත්කම් විධිමත්ව ලේඛනගත කිරීම, මූල්‍ය නොවන ආධාර, ප්‍රදාන ලේඛන ගත කිරීම විධිමත් පරිදි භාණ්ඩාගාරිකවරයා විසින් සිදුකළ යුතු ය.

6.6 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ (මූල්‍ය) වෙත පවරනු ලබන රාජකාරි මැනවින් ඉටුකළ යුතු වේ.

6.7 වාර්ෂික අවසන් ගිණුම් පිළියෙල කර විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත යොමුකිරීම සහ විගණන වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

07. **පදනමේ මුදල් ගණුදෙනු හා ගිණුම්**

7.1 මුදල් හා බැංකු ගණුදෙනු

7.1.1 පදනම විසින් බැංකු ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් හා ස්ථාවර තැන්පත් ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

7.1.2 බැංකුවල මුදල් තැන්පත් ආපසු ගැනීමේ හා වැය දැරීමේ ලියකියවිලි හා චෙක්පත් පදනමේ සභාපතිවරයා හා භාණ්ඩාගාරිකවරයා විසින් අත්සන් තැබිය යුතු ය.

7.1.3 පදනමට ලැබෙන සියලු මුදල් බැංකු ගතකළ යුතු අතර, ගෙවීම් කිරීමේ දී බැංකු ගනුදෙනු ලෙස සිදුවිය යුතු ය. එහෙත් අක්මුදල් පවත්වාගෙන යාම හා අක්මුදල් වැය දැරීමට මින් බාධාවක් නොවන්නේ ය.

7.1.4 සියලු ගෙවීම් සඳහා අධිකාරි බලය, අනුමත කිරීම සභාපතිවරයා සතු වන අතර, භාණ්ඩාගාරික සියලු ගෙවීම් සහතිකකර ගෙවීම් කළ යුතු ය.

7.2 ගිණුම්

7.2.1 පදනමේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වන්නේ ය.

7.2.2 ගණුදෙණුවලට අදාළ ප්‍රධාන ගිණුම්, ලෙජර් ගිණුම්, පෞද්ගලික ලෙජර් ගිණුම් විධිමත්ව පවත්වාගෙන යා යුතු ය.

7.2.3 මුදල් වර්ෂය අවසන් වී මාස 03ක් ඇතුළත අවසන් ගිණුම් පිළියෙලකර පනතේ 10 (3) වගන්තියේ විධිවිධාන ප්‍රකාර විගණනයට ඉදිරිපත් කළ යුතු ය.

7.2.4 ඉහත 7.2.3 අනුව විගණනය සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රථම වාර්ෂික මහා සභාවට ගිණුම් වාර්තාව ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු වේ.

08. **පදනමේ කාර්ය මණ්ඩල පිළිබඳ විධිවිධාන**

8.1 පදනමට අවශ්‍ය සේවක සංඛ්‍යාව තීරණය කිරීම, වැටුප් හා දීමනා තීරණය කිරීම, බඳවා ගැනීම, උසස් කිරීම, සේවයෙන් පහකිරීම, සේවය අවසන් කිරීමේ බලය හා සේවක පාලන රීති සම්පාදන බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතු ය.

8.2 සේවකයින් සම්බන්ධයෙන් පත්වීම් හා විනය බලධරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල පදනමේ සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැක.

8.3 පදනමේ කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ එහි සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂවරයා වේ.

8.4 පදනමට අවශ්‍ය උපදේශක සේවා ලබාගැනීමට උපදේශකවරුන් පත්කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය. උපදේශකවරුන් කාර්ය මණ්ඩල සාමාජිකයින් නොවන්නේ ය.

09. **පදනමේ රැස්වීම්**

9.1 පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, විශේෂ මහා සභා රැස්වීම් හා මහා සභා රැස්වීම් කැඳවීම විධිමත්ව පදනමේ ලේකම්වරයා විසින් සිදුකළ යුතු ය.

9.2 වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත දිනයට දින 14 පෙරාතුව ද, විශේෂ මහා සභා රැස්වීම් දින 07කට පෙරාතුව ද, රැස්වීමේ න්‍යාය පත්‍රය හා ආනුෂාංගික ලියකියවිලි ද සහිතව සාමාජිකයින් වෙත දැනුම්දිය යුතු ය.

9.3 පනත, රීති හා මහා සභා තීරණ ආදියෙන් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් විධිවිධානයන් පැනවීම හා තීරණ ගැනීමට සභාපතිවරයා වෙත බලය ඇත්තේ ය.

10. **සමිතියේ නිල මුද්‍රාව**

10.1 සමිතියේ නිල මුද්‍රාවක් පැවතිය යුතු ය.

10.2 නිල මුද්‍රාව පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් භාරයේ පැවැතිය යුතු අතර, එය සුපරික්ෂාකාරි ලෙස තබාගැනීම ඔහුගේ වගකීම වේ.

10.3 නිල මුද්‍රාව තබා සිදුකරනු ලබන කටයුතුවල දී සභාපතිවරයා හා ලේකම්වරයා යන දෙදෙනාම අත්සන් කළ යුතු ය.

එස්. ඒ. ඩී. එස්. එල්. වීරසිංහ,
ලේකම්/අධ්‍යක්ෂ (සංවර්ධන හා සාමාජික සබඳතා),
පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම.

පී. හැරිසන්,
සභාපති,
පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම.

05-612